# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

ග්‍රාමීය සංවර්ධන , සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය
கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை அமைச்சு
Ministry of Rural Development, Social Security and Community Empowerment


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/13/HR/Admin//2026 Circular | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ……………………………… | දිනය<br>திகதி<br>Date | 2026.01. 28 |

සමෘද්ධි චක්‍රලේඛ අංක :- **2026/08**

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම සමෘද්ධි පුහුණු මධ්‍යස්ථාන භාර නිලධාරීන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන්,

## <u>මානව සම්පත් සංවර්ධන වැඩසටහන - 2026</u>

### 1. හැඳින්වීම.

"වසර 2030 වන විට දුගී බවෙන් තොර, සවිබලගැන්වූ සමෘද්ධිමත් ශ්‍රී ලංකාවක් බිහි කිරීමට කටයුතු කරන පුරෝගාමී ආයතනය බවට පත්වීම" නමැති "දැක්ම" සැබෑ කර ගැනීමට කටයුතු කිරීම සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ප්‍රධාන කාර්ය භාරය වේ. එම නිසා දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ජය ගැනීමට තම දායකත්වය තනිව හා සාමූහිකව ලබා දෙන මෙම නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා කුසලතා කාලීන අවශ්‍යතා මත යාවත්කාලීන කළ යුතුව ඇති අතර එම වගකීම පැවරී ඇත්තේ මානව සම්පත් සංවර්ධන අංශයටයි.

ඒ අනුව, 2026 වර්ෂයේ මානව සම්පත් සංවර්ධන අංශයේ මූලික ඉලක්කය වනුයේ සමෘද්ධිමත් ජාතියක් ගොඩනඟා ජාතික ආර්ථිකයට දායක වීමට වෙර දරන අඩු ආදායම්ලාභී පවුල් **"සවිබලගැන්වීම"** සඳහා දැනුම, කුසලතා හා ධනාත්මක ආකල්ප වලින් සමන්විත කාර්යක්ෂම ගති ලක්ෂණ වලින් තෘප්තිමත් මානව ප්‍රාග්ධනයක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව තුළ ජනිත කිරීමයි. මෙම අරමුණු හා ඉලක්කයන් සාක්ෂාත් කර ගත හැකි වන පරිදි මානව ප්‍රාග්ධනයක් බිහි කිරීම උදෙසා මානව සම්පත් සංවර්ධන අංශයේ 2026 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. ඒ අනුව පහත සඳහන් වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

1. ප්‍රජා සවිබලගැන්වීමේ වැඩසටහන ඉලක්ක කරගත් පුහුණු කිරීම්
    a. ප්‍රධාන පුහුණුකරුවන් පුහුණුව ( Training of Master Trainers)
    b. ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම
    c. ක්ෂේත්‍ර නිලධාරීන් මගින් ප්‍රජාව දැනුවත් කිරීම
2. ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධව පුහුණුව ලබා දීම
3. දිස්ත්‍රික් මට්ටමින් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව ලබා දීම.
4. උපාධි /පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.


1වන අදියර,4 වන මහල , සෙත්සිරිපාය , බත්තරමුල්ල. / 1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல / 1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන) / மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்) / Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director (Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2869824 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@gmail.com | adsamurdhi2014@gmail.com | finance@samurdhi.gov.lk | **Hot Line:0112-885582** | **Hot Line: 011- 28872** |
| | | **Hot Line :0112-873996** | | | |

5. උපාධි /පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
6. විදේශ ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධීකරණය සහ අත්දැකීම් හුවමාරු අවස්ථා සඳහා නිලධාරින් යොමු කිරීම.
7. පුහුණු මධ්‍යස්ථාන අධීක්ෂණය/ පරිපාලනය.
8. පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.
9. මානව සම්පත් සංවර්ධන අංශයේ වැඩසටහන් වලට අදාළ ප්‍රගති සමාලෝචනය.
10. අධීක්ෂණය හා පසු විපරම් කටයුතු.
11. පොදු උපදෙස්.

මේ අනුව 2026 වසර තුළ මානව සම්පත් සංවර්ධන අංශයේ සමස්ථ ක්‍රියාවලියේ ඉහත කරුණු 11 ක් යටතේ මෙහෙයවීමට අදාළ කටයුතු සැලැසුම් කර ඇති අතර ඒ පිළිබඳ විස්තර පහත සඳහන් වේ.

**01. ප්‍රජා සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ඉලක්ක කරගත් පුහුණු කිරීම.**

ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහන ඉලක්ක කරගෙන 2025 වර්ෂයේ ප්‍රධාන මාතෘකා කිහිපයක් යටතේ නිලධාරීන් පුහුණු කර, ඔවුන් මගින් ක්ෂේත්‍ර නිලධාරීන් සහ ප්‍රජාව පුහුණු කරන ලදී. එය තවදුරටත් ඉදිරියට පවත්වාගෙන යමින් 2026 වර්ෂයේද ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහනට අදාළව පහත සඳහන් ක්ෂේත්‍රයන් යටතේ නිලධාරීන් පුහුණු කිරීමට සැලසුම් කර ඇත.

i. මූල්‍ය සාක්ෂරතා පුහුණුව.
ii. ජීවන කුසලතා සංවර්ධන පුහුණුව.
iii. වෘත්තීය පුහුණු පාඨමාලා ග්‍රාමීය මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳ පුහුණුව.
iv. 2025 වසරේ පවත්වන ලද පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම, ව්‍යාපාර හැකියා සංවර්ධනය සහ මානසික උපදේශණය පිළිබඳ පුහුණු කළ නිලධාරීන්ගේ දැණුම ආවර්ජනය කිරීමේ (Re fresher) පුහුණුව.

ඉහත පුහුණු වැඩසටහන් අදියර 03 ක් යටතේ පැවැත්වීමට සැලසුම් කර ඇත.

1) පලමු අදියර -
ප්‍රධාන පුහුණුකරුවන් පුහුණුව ( Training of Master Trainers)

මෙම පලමු අදියරයට අයත් වන්නේ, ලංකාවේ සියළුම දිස්ත්‍රික්කවල සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය කරමින් පුහුණුකරුවන් ලෙස කටයුතු කළ හැකි , දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් විසින් නම් කර එවන ලද නිලධාරීන්ගෙන් සමන්විත ප්‍රධාන පුහුණුකරුවන් (Master Trainer) පුහුණු කර පුහුණුකරු සංචිතයක් (TOT) සකස් කිරීම.

ප්‍රජාව සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන ශ්‍රී ලංකාවේ සියළුම දිස්ත්‍රික්කවල සියළුම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ නියෝජනය වන පරිදි තෝරා එවන ලද නිලධාරීන්ගෙන් 335 දෙනෙකු බැගින් ප්‍රධාන පුහුණුකරුවන් ලෙස පුහුණු කිරීම සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානවලදී සිදු කිරීමට මානව සම්පත් සංවර්ධන අංශය කටයුතු කරනු ලැබේ. ඒ අනුව ඉහත සඳහන් ක්ෂේත්‍ර 04 යටතේ ප්‍රධාන පුහුණුකරුවන් ලෙස කණ්ඩායම් 04 ක් පුහුණු කිරීමට 2026 වර්ෂයේ සැලසුම් කර ඇත. ප්‍රජාව සවිබලගැන්වීමේ ජාතික වැඩසටහනේ ඉලක්ක සහ

අරමුණු වලට අදාළ වන පරිදි ඉහත පුහුණු වැඩසටහන්වලට අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම විෂය දැණුමැති නිලධාරීන්ගේ සහයෝගයෙන් කරනු ලැබේ. බොහෝ විට ආසියානු සංවර්ධන බැංකු හදිසි ජීවනෝපාය සංවර්ධන ණය වැඩසටහන සඳහා සකස් කරන ලද පුහුණු මොඩියුල අවශ්‍ය පරිදි සංශෝධනය කර සවිබලගැන්වීමේ ජාතික වැඩසටහනේ පුහුණු වැඩසටහන් සඳහා යොදා ගනු ලැබේ.

2) අදියර -

**ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීම**

ඉහත 01 අදියර යටතේ පුහුණු කරන ලද ප්‍රධාන පුහුණුකරුවන් මඟින් ප්‍රජාව සවිබලගැන්වීමේ වැඩසටහනට සෘජුවම දායකවන සමෘද්ධි සංවර්ධන් නිලධාරීන්, සමෘද්ධි කළමනාකරුවන් සහ සමෘද්ධි රාජකාරි පැවරුණු සංවර්ධන නිලධාරීන් සහ දැනුවත් කිරීමට සැලසුම් කර ඇත.

ප්‍රජාව සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන සඳහා සෘජුවම සම්බන්ධව වන නිලධාරීන් දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීම, මෙහයවීම සහ සංවිධානය කිරීම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂක ගේ වගකීම වන අතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ දී ප්‍රාදේශීය ලේකම් ගේ අධීක්ෂණය යටතේ අදාළ විෂයභාර නිලධාරියා විසින් ඉටුකළ යුතුය. ඒ ඒ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ග්‍රාම නිලධාරි වසම් භාරව කටයුතු කරන සමෘද්ධි සංවර්ධන නිලධාරීන් සහ ව්‍යාපෘති කළමනාකරුවන් ඇතුලු ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණු කිරීමේ දී ප්‍රධාන පුහුණුකරුවන් පමණක් සම්පත්දායකයින් ලෙස යොදා ගත යුතුය.

එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින් අවම වශයෙන් ක්ෂේත්‍ර නිලධාරීන් 50 ක් මෙම ප්‍රාදේශීය මට්ටමින් පවත්වන පුහුණු වැඩසටහන සඳහා සහභාගි කරවිය යුතු අතර යම් හෙයකින් පුහුණුවන්නන් සංඛ්‍යාව 50 ට අඩුනම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් එකතු කර නිලධාරි පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය. මෙම පුහුණු වැඩසටහන් එක් දින පුහුණු වැඩමුළු ලෙස දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකගේ උපදෙස් මත විෂයභාර කළමනාකරුවන් විසින් සංවිධානය කළ යුතුය. ඒ අනුව එක් එක් දිස්ත්‍රික්කයේ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි කරවිය යුතු සමස්ථ නිලධාරි සංඛ්‍යාව ඇමුණුමේ සඳහන් වේ.

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පවත්වන එක් පුහුණු වැඩසටහනක් සඳහා පහත සීමාවන්ට යටත්ව සංග්‍රහ වියදම්, ලිපි ද්‍රව්‍ය හා සම්පත්දායක දීමනා ලෙස වැය කළ හැකිය.

1. පුහුණු වැඩසටහනට සහභාගි වන එක් අයෙකු සඳහා
    a) උදේ තේ, දිවා ආහාර හා සවස තේ - රු. 800.00
    b) ලිපි ද්‍රව්‍ය ලබාදීම - රු. 50.00
2. සම්පත්දායක දීමනා පැයකට 1400.00 බැගින් පැය 03 ක් සඳහා - රු. 4200.00

(සම්පත්දායක දීමනා ගෙවීම නව රා. ප. චක්‍රලේඛවල සඳහන් උපදෙස් පරිදි කටයුතු කළයුතුවේ)

**දැනුම ආවර්ජනය කිරීම සඳහා ක්ෂේත්‍ර නිලධාරීන්ට පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම**

ප්‍රජාව සවිබලගැන්වීමේ ජාතික වැඩසටහන යටතේ පවුල් සංවර්ධන සැලසුම් සකස් කිරීම, ව්‍යාපාර හැකියා සංවර්ධනය සහ මානසික උපදේශණය පිළිබඳව අදාළ නිලධාරීන්ට පසුගිය 2025 වසරේ දැණුම සහ පුහුණුව ලබාදී ඇත. එම දැණුම උපයෝගී කරගෙන ක්ෂේත්‍ර කටයුතු ඉටු කරන ලද නිලධාරීන් ප්‍රයෝගික අත්දැකීම් ලබා ඇති බැවින්, එම වැඩසටහන් තවදුරටත් සංවර්ධනය කර ක්‍රියාත්මක කළ යුතු නිසා එලෙස පුහුණු කළ නිලධාරීනුගේ දැණුම නැවත ආවර්ජනය කිරීමේ අරමුණින් මෙම පුහුණු වැඩසටහන් පැවැත් වීමට සැලසුම් කර ඇත. මෙම පුහුණු වැඩසටහන් ප්‍රධාන පුහුණුකරුවන් මඟින් වරුවක පමණ කාලයක් යොදාගෙන පැවැත්වීම ප්‍රමාණවත් වේ. මෙම පුහුණු වැඩසටහන් ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ අනුව සංවිධානය කිරීම සුදුසු වන අතර එකී පුහුණු වැඩසටහන් සඳහා අවම වශයෙන් ක්ෂේත්‍ර නිලධාරීන් 50 ක් සහභාගී විය යුතුය. එසේ නොවන අවස්ථාවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ කිහිපයක් එකට එකතු කර එක් ස්ථානයක පුහුණු වැඩසටහන් පැවැත්විය යුතුය.

ප්‍රාදේශීය මට්ටමේ වරුවක පුහුණු වැඩසටනක් සඳහා වියදම් කළ යුතු ආකාරය :

| | | |
|---|---|---|
| 1. සහභාගිවන්නන් එක් අයෙකු සඳහා තේ | - | රු. 200.00 |
| 2. සම්පත් දායක දීමනා | - | රු. 2,800.00 වැය කළ හැක. |

3) අදියර

**ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් ප්‍රජාව දැනුවත් කිරීම**

ඉහත 01 සහ 02 අදියර යටතේ පුහුණු කරන ලද පුහුණුකරුවන් සහ ක්ෂේත්‍ර නිලධාරීන් මඟින් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා තෝරාගත් ප්‍රජාව දැනුවත් කිරීම සහ පුහුණු කිරීම මෙම අදියරේ දී සිදු කරනු ලැබේ. සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා තෝරාගත් ප්‍රජාව දැනුවත් කිරීමේ සහ පුහුණු කිරීමේ වැඩසටහන් ජීවනෝපාය සංවර්ධන අංශය මඟින් සංවිධානය කරනු ලැබේ.

**02. ප්‍රධාන කාර්යාලයේ කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධව පුහුණුව ලබා දීම.**

අධිකාරීන් තුනක එකතුවෙන් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව සැදුම් ලත් බැවින් එම අධිකාරීන් තුනේ නිළධාරීන් එක් දෙපාර්තමේන්තුවක රාජකාරි කිරීමේදී ආයතනික හා පරිපාලන කටයුතු පිළිබඳව දැණුම කුසලතා හා ධනාත්මක ආකල්පයන්, යාවත්කාලීන කළයුතුව ඇත. දෙපාර්තමේන්තු ගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීනතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත.

**2.1. මෙම පුහුණුව පහත විෂය ක්ෂේත්‍රයන්ට අදාළව ලබා දිය යුතුවේ.**

i. ආයතනික හා පරිපාලන කටයුතු (ආයතන සංග්‍රහය)
ii. කාර්යාල කළමණාකරණය හා 5S ක්‍රමය
iii. මුදල් රෙගුලාසි (මුදල් සංග්‍රහය)
iv. විමර්ශන කටයුතු
v. විගණන කටයුතු

ආදී වශයෙන් තම අංශයට අදාළව පුහුණු කළ යුතු නිලධාරීන් පිළිබඳ තොරතුරු එක් එක් අංශ ප්‍රධානීන් විසින් මානව සම්පත් සංවර්ධන අංශය වෙත ලබා දිය යුතුය. ඒ ඒ අංශ වල අවශ්‍යතාවය මත මෙම පුහුණු වැඩසටහන් මානව සම්පත් සංවර්ධන අංශය මගින් සංවිධානය කර ක්‍රියාත්මක කරනු ලැබේ.

මේ සඳහා වන වැය ඇස්තමේන්තුවක් හා පුහුණු අන්තර්ගතය ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳව පුහුණු සැලැස්ම 2026 මාර්තු 31 දිනට පෙර සකස් කර මානව සම්පත් සංවර්ධන අංශය වෙත සැපයිය යුතුවේ. මෙම පුහුණුව වසරේ තෙවන කාර්තුව අවසන් වීමට පෙර නිම කිරීම අනිවාර්ය වේ.

## 03. දිස්ත්‍රික් මට්ටමින් කාර්ය මණ්ඩලය සඳහා විෂයානුබද්ධ පුහුණුව.

දෙපාර්තමේන්තුගත සේවකයින් ලෙස දැනුවත් විය යුතු පොදු චක්‍රලේඛ අණ පනත් වලට අමතරව තමා නියැලෙනු ලබන විෂය ක්ෂේත්‍රයේ ප්‍රවීණතාවය හා කාර්යසාධනය ඉහළ නැංවීම අරමුණු කර ගෙන මෙම විෂයානුබද්ධ පුහුණුව ලබා දීමට සැලසුම් කර ඇත. මේ යටතේ, පරිපාලන හා ආයතන, ගිණුම් හා මූල්‍ය පරිපාලන, විගණන හා විමර්ශණ, ව්‍යවසායකත්ව සංවර්ධන, අලෙවි යන ක්ෂේත්‍ර වලටත්, ක්ෂුද්‍රමූල්‍යකරණය හා සමෘද්ධි බැංකු ගිණුම් ක්‍රියාවලිය, සමාජ සංවර්ධන, ප්‍රජා මූල සංවිධාන පිළිබඳ අදාළ පුහුණු වැඩසටහන් පැවැත්වීමටත්, සැළසුම් කර ඇත.

මේ සඳහා දිස්ත්‍රික් මට්ටමින් / ප්‍රාදේශීය මට්ටමින් නිලධාරීන්ට ලබා දිය යුතුයැයි හඳුනාගත් පුහුණු අවශ්‍යතා හඳුනාගෙන, වඩාත් සුදුසු පුහුණු වැඩ සටහන තෝරා ගැනීම පලමුවෙන් සිදු කළ යුතු අතර ඒ අනුව පුහුණු අන්තර්ගතය, ක්‍රියාත්මක වන ආකාරය සහ වැය ඇස්තමේන්තුවක් සහිත සංෂිප්ත පුහුණු සැලැස්මක් සකස් කර එම සැලැස්මේ පිටපතක් මානව සම්පත් සංවර්ධන අංශයට ඉදිරිපත් කර ප්‍රතිපාදන නිදහස් කර ගැනීම දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් සිදු කළ යුතුය. ඉහත පුහුණු වැඩසටහන් සැලසුම් කිරීමේ දී, එහි තොරතුරු ඇතුලත් දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් වලට අවශ්‍ය ප්‍රතිපාදන මෙම චක්‍ර ලේඛයේ ඇමුණුම් **HR/01.I** හි සඳහන් පරිදි වෙන්කර ඇත.

## 04. උපාධි /පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබා දීම.

4.1. සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථිර කාර්ය මණ්ඩලයේ නිලධාරීන් සඳහා සමෘද්ධි ජාතික සභාව විසින් අනුමත කරන ලද නිර්නායක වලට අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණට හා අදාළ තනතුරේ කාර්යයභාරය වඩාත් ඵලදායීව ඉටුකිරීමට සෘජුව දායක වන, රජයේ විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, වල පවත්වන පාඨමාලා තෝරාගනු ලැබ ඇති අවස්ථාවල අදාළ දේශීය හා විදේශීය පාඨමාලා සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ හා දෙපාර්තමේන්තු වල රාජ්‍ය නිලධාරීන්ට අදාළ වන්නා වූ අනෙකුත් විධිවිධාන වලට යටත්ව පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.

4.2 තවද, මෙම පාඨමාලා පවත්වනු ලබන ස්ථාන රජයේ විශ්ව විද්‍යාල, වෘත්තීය පුහුණු ආයතන, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම (UGC), /තෘතියික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ(TVEC) හෝ විසින් පිළිගනු ලබන දේශීය, විදේශීය උසස් අධ්‍යාපන ආයතන විය යුතුය.

4.3 මෙම පාඨමාලා සඳහා මූල්‍ය ප්‍රතිපාදන ඉල්ලුම් කරනු ලබන නිලධාරීන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට නිර්දේශ සහිතව අවශ්‍ය ලේඛන ඉදිරිපත් කළ යුතුය.

- ඉල්ලුම් පත්‍රය හා ගිවිසුම් පත්‍රය
- අදාළ පාඨමාලාව අයත් ආයතනය මඟින් තෝරාගත් බවට නිකුත් කළ ලිපිය
- ගාස්තු ගෙවූ රිසිට් පත් වල මුල් පිටපත්
- බැංකු ගිණුමේ පාස් පොතේ පිටපත්
- පාඨමාලාව සම්පූර්ණ කර ඇතිනම් සහතික පත්‍රය.

මේ සමඟ අමුණා ඇති පාඨමාලාවට ඉල්ලුම් කිරිම සඳහා අවශ්‍ය වන ඉල්ලුම් පත්‍රය ඇමුණුම /HR/02 මඟින්ද ඒ සඳහා අවශ්‍යවන ගිවිසුම් පත්‍රය ඇමුණුම /HR/03 මඟින්ද දක්වා ඇත.

**05. විදේශ ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධීකරණය සහ අත්දැකීම් හුවමාරු අවස්ථා සඳහා නිලධාරීන් යොමු කිරීම.**

5.1. දුගී ජනතාව සවිබලගැන්වීම සඳහා කලාපීය රටවල් වල ක්‍රියාත්මක සංවර්ධන වැඩසටහන් වල අත්දැකීම් ලබා දීමේ අරමුණ ඇතිව කෙටි කාලීන විදේශ සංචාර සඳහා අභ්‍යන්තර කාර්යමණ්ඩලයේ වඩා කැපවීමෙන් සහ උනන්දුවෙන් කටයුතු කරන නිලධාරීන් යොමු කිරීම මෙම වැඩසටහන යටතේ සිදුවේ. විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සහ මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛ උපදෙස් අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

5.2. දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබන නිලධාරීන් වෙත ප්‍රදානය කරනු ලබන විදේශීය ශිෂ්‍යත්ව පාඨමාලා සම්බන්ධයෙන් දිස්ත්‍රික් / ප්‍රධාන කාර්යාලයේ අංශ ප්‍රධානීන් දැනුවත් කර සුදුසු නිලධාරීන් විදේශ ශිෂ්‍යත්ව සඳහා යොමු කිරීම, එම කටයුතු සම්බන්ධීකරණය කිරීම මානව සම්පත් සංවර්ධන අංශය මඟින් සිදු කරනු ලැබේ.

**06. පුහුණු මධ්‍යස්ථාන අධීක්ෂණය සහ පරිපාලනය**

6.1 සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ප්‍රාදේශීයව පිහිටුවා ඇති පුහුණු මධ්‍යස්ථාන අධීක්ෂණය සහ පරිපාලනය මානව සම්පත් සංවර්ධන අංශය මඟින් සිදු වේ. මූලික වශයෙන් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල පුහුණුව සඳහා භාවිතා කිරීමටත්, ඊට අමතරව රජයේ සහ පෞද්ගලික අංශ වලට අවශ්‍ය පහසුකම් ලබාදීමත්, එමඟින් පුහුණු මධ්‍යස්ථානයේ ආදායම් උත්පාදනයට මඟ පෙන්වා දීමත් අපේක්ෂා කෙරේ.

6.2 පහත සඳහන් මධ්‍යස්ථාන සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවට අයත් ජාතික පුහුණු මධ්‍යස්ථාන ලෙස ක්‍රියාත්මකවේ.

| | |
|---|---|
| බලංගොඩ - සමනලවැව පුහුණු මධ්‍යස්ථානය | - 045 - 3499821 |
| පේරාදෙණිය -නිල්ලඹ පුහුණු මධ්‍යස්ථානය | - 081 - 2067215 |
| මාතර - මාතර සමෘද්ධි පුහුණු මධ්‍යස්ථානය. | - 041 -2230015 |
| ත්‍රිකුණාමලය - නිලාවේලි සමෘද්ධි මධ්‍යස්ථානය | - 026 - 2232335 |

6.3 දිස්ත්‍රික් මට්ටමින් ඉහත මධ්‍යස්ථානවල පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේ දී ස්ථානභාර නිලධාරීන් සමග සාකච්ඡා කර, ඇස්තමේන්තු සකස් කිරීම හා සැලසුම් කිරීම වඩාත් යෝග්‍ය වනු ඇත.

6.4 එලෙසම, මෙම මධ්‍යස්ථාන පුහුණු කටයුතු සඳහා වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව යොදා ගැනීම අපේක්ෂා කරන බැවින් ඔබ දිස්ත්‍රික්කයේ රාජ්‍ය හා පෞද්ගලික අංශයේ පුහුණු වැඩසටහන් මෙම මධ්‍යස්ථාන වෙත යොමු කිරීමට හැකි වන පරිදි ප්‍රචාරණාත්මක වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වැදගත් වනු ඇත.

6.5 එමෙන්ම, ගිණුම් අංශය මගින් නිකුත් කරන ලද, පුහුණු මධ්‍යස්ථාන වල මූල්‍ය හා පරිපාලන උපදෙස් මත මධ්‍යස්ථානයේ පහසුකම් බාහිර පාර්ශව වලට ලබා දීමේ විධිමත් වැඩපිළිවෙලක් අනුව ආදායම් උත්පාදනය කිරීමටත් මධ්‍යස්ථාන භාර නිලධාරීන් කටයුතු කළ යුතුය.

6.6. ඉහත පුහුණු මධ්‍යස්ථාන වල කාර්තුමය ප්‍රගතිය, මධ්‍යස්ථානභාර නිලධාරීන් විසින් මානව සම්පත් සංවර්ධන අංශයට ත්‍රෛමාසිකව ඉදිරිපත් කළ යුතුය

## 0.7 පුහුණු වැඩසටහන් සඳහා මූල්‍ය ප්‍රතිපාදන.

අදාළ වර්ෂය සඳහා දෙපාර්තමේන්තුවේ අනුමත ක්‍රියාත්මක සැලැස්මට අනුව අභ්‍යන්තර කාර්යමණ්ඩල පුහුණුව සඳහා වෙන්වී ඇති ප්‍රතිපාදන වලින් පුහුණු වැඩසටහන් සඳහා මුදල් වැයකරනු ලැබේ. දිස්ත්‍රික් පුහුණු වැඩසටහන් වලට අවශ්‍ය ප්‍රතිපාදන ඇමුණුම් **HR/01.1, HR/01.1I, HR/01.III, HR/01.IV,** හි සඳහන් පරිදි වෙන්කර ඇත. (මීට අමතරව ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා දිස්ත්‍රික් අධ්‍යක්ෂවරුන් විසින් 331-02-02-02401 ශීර්ෂය යටතේ ප්‍රතිපාදන ලබාගැනීම සඳහා වැය ඇස්තමේන්තු වෙන් වෙන්ව මානව සම්පත් සංවර්ධන අංශය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කරනු ලැබේ.)

ඊට අමතරව දෙපාර්තමේන්තමේන්තුවේ අනෙකුත් අංශ මගින් ද හඳුනාගෙන ක්‍රියාත්මක කළ යුතු පුහුණු වැඩසටහන් සඳහා එම අංශවල ප්‍රතිපාදන ලබා ගැනීමට කටයුතු කළ යුතු අතර එසේ ප්‍රතිපාදන නොමැති අවස්ථාවල අත්‍යවශ්‍ය පුහුණු සඳහා අදාළ ඇස්තමේන්තු මානව සම්පත් සංවර්ධන අංශය වෙත ඉහත ආකාරයෙන් ඉදිරිපත් කළ යුතුය.

## 08. මානව සම්පත් සංවර්ධන අංශයේ වැඩසටහන් වලට අදාළ ප්‍රගති සමාලෝචනය

8.1 මානව සම්පත් සංවර්ධන අංශයට අදාළ කාර්යයන් පිළිබඳව ප්‍රගති සමාලෝචනය හා පසුවිපරම ඉතා වැදගත් කාර්යයක් වන බැවින් එම කාර්යය පහත සඳහන් පරිදි සංවිධානය කළ යුතුය.

| ප්‍රගති සමාලෝචන මට්ටම | යෝජිත කාල පරාසය | මෙහෙයුම් වගකීම |
|---|---|---|
| ප්‍රාදේශීය මට්ටම | මසකට වරක් - සමාන්‍ය ප්‍රගති සමාලෝචනයේ එක් විෂයක් ලෙස | මූලස්ථාන කළමණාකරු |
| දිස්ත්‍රික් මට්ටම | දෙමසකට වරක් | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ |
| පුහුණු මධ්‍යස්ථාන මට්ටම | මසකට වරක් | ස්ථාන භාර නිලධාරී |
| ජාතික මට්ටම | තෙමසකට වරක් | අධ්‍යක්ෂ මානව සම්පත්(මානව සම්පත් සංවර්ධන ) |

8.2 පුහුණු මධ්‍යස්ථාන වල ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් වල මාසික ප්‍රගතියත්, පුහුණු මධ්‍යස්ථානවල කුඩා ව්‍යාපෘති මගින් ලැබෙන ආදායම් ප්‍රගතියත් ඇමුණුම **HR/04** හා ඇමුණුම HR/05 අනුව සකස් කර, සෑම මසකම 10 වන දිනට පෙර මානව සම්පත් සංවර්ධන අංශයට ලබා දීමට කටයුතු කළ යුතුවේ.

8.3 මානව සම්පත් සංවර්ධන අංශයේ කාර්යයන් දිස්ත්‍රික් මට්ටමින් සම්බන්ධීකරණය කිරීම සඳහා කළමනාකරුවකු අනුයුක්ත කළ යුතු අතර, එමගින් මෙම කාර්යය වඩාත් ඵලදායීව හා කාර්යක්ෂමව ඉටුකර ගත හැකිවනු ඇත.

8.4 මූල්‍ය ප්‍රතිපාදන දිස්ත්‍රික්කයට ලැබීමෙන් අනතුරුව එහි ප්‍රගතිය ඇමුණුම HR/06 අනුවත් , මූල්‍ය ප්‍රතිපාදන අනතුරුව එහි ප්‍රගතිය ඇමුණුම HR/07 අනුව දිස්ත්‍රික්කයට පිටපත් සහිතව ප්‍රධාන කාර්යාලයේ මානව සම්පත් සංවර්ධන අංශයට එවිය යුතුය.

8.5 ඊට අමතරව පුහුණු වැඩසටහන සිදුකළ ආකාරය පිළිබඳව වාර්තාවක් හා අදාළ ඡායාරූප ප්‍රජා මූල බැංකු සමිති කළමණාකරු විසින් මානව සම්පත් සංවර්ධන අංශයටද පිටපත් සහිතව දිස්ත්‍රික් පුහුණු කළමණාකරු වෙත ඉදිරිපත් කළ යුතුය.

## 09. අධීක්ෂණය හා පසු විපරම් කටයුතු.

9.1 මානව සම්පත් සංවර්ධන අංශයේ සිදුකරනු ලබන සෑම පුහුණු වැඩසටහනකම දිස්ත්‍රික් අධීක්ෂණය, දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂගේ වගකීම වේ. පසු විපරම් කටයුතු මානව සම්පත් විෂය භාර කළමණාකරු විසින් නිරන්තරයෙන් සිදුකළ යුතුය. දිස්ත්‍රික්කයට මූල්‍ය ප්‍රතිපාදන ලද විගස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට ප්‍රතිපාදන නිදහස් කළ යුතුය. දෙවන, තෙවන කාර්තුවට පෙර වැඩසටහන් සිදුවන්නේද යන්න පසු විපරම් කළ යුතුය.

9.2 2026 වර්ෂයේ ඔක්තෝම්බර් වන විට සියළු පුහුණු වැඩසටහන් අවසන් විය යුතු අතර, දිස්ත්‍රික්කයේ අමතර මුදල් ඉතිරිව තිබෙනම් ඔක්තොම්බර් 30ට පෙර අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන වෙත ඉදිරිපත් කළ යුතුය.

## 10. පොදු උපදෙස්.

10.1. මානව සම්පත් සංවර්ධන අංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන පුහුණු වැඩසටහන් සඳහා වන වියදම් ඇස්තමේන්තු දෙපාර්තමේන්තුවේ මුදල් අංශය විසින් නිකුත් කරණු ලබන මූල්‍ය උපදෙස් වලට අනුකූල විය යුතුය.

10.2 පුහුණු හා පාඨමාලා හැදෑරීම පිළිබඳව අදාළ රාජ්‍ය පරිපාලන නීතිරීති හා ආයතන සංග්‍රහය ආදී වූ රාජ්‍ය දෙපාර්තමේන්තුවක සේවකයන්ට බලපාන නීති රෙගුලාසි අදාළ වන්නේය.

10.3 දිස්ත්‍රික් මට්ටමින් හඳුනාගත් පුහුණු පාඨමාලා හැකි සෑම අවස්ථාවකදීම මෙම දෙපාර්තමේන්තුවේ පුහුණු මධ්‍යස්ථානවල පැවැත්වීමට කටයුතු කළ යුතු අතර වැඩසටහන් සංවිධානය කිරීමේ දී එම මධ්‍යස්ථාන සමග නිසි සම්බන්ධීකරණයක් සහිත සැලසුම් කළ යුතු වේ.

10.4 පුහුණු වැඩසටහන් සඳහා සම්පත්දායකයින් යොදා ගැනීමේ දී මෙම දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට ප්‍රමුඛතාවය ලබා දිය යුතු අතර, ඒ ඒ විෂය ක්ෂේත්‍රයන්ට අදාළ ඒ ඒ සංචිතයේ පුහුණුකරුවන්ගේ සේවය ලබා ගැනීමට කටයුතු කළ යුතුය.

10.5 එක් එක් විෂය ක්ෂේත්‍රය පිළිබඳව විශේෂඥ දැණුමක් සහිත සම්පත්දායකයින් අවශ්‍ය වන අවස්ථාලවලදී දෙපාර්තමේන්තුවෙහි අදාළ සුදුසුකම් සපුරා ඇති සම්පත්දායකයින් නොමැති නම් එම විෂය ක්ෂේත්‍ර සඳහා බාහිර විශේෂඥ සම්පත්දායකයින් යොදවා පුහුණු වැඩසටහන් පැවැත්වීමට කටයුතු කළ යුතුය.

10.6 විශේෂඥ සම්පත්දායකයන් හා දෙපාර්තමේන්තු සම්පත්දායකයන් අදාළ කාර්යයන් සඳහා යොදවා ගැනීම පහසුවීම පිණිස ඔවුන්ගේ පුහුණු සුදුසුකම් ද ඇතුලත් යාවත්කාලීන දත්ත පද්ධතියක් මානව සම්පත් සංවර්ධන අංශයට අමතරව, දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වලද පවත්වාගෙන යා යුතුය.

10.7 හඳුනා ගන්නා ලද විශේෂ පුහුණු වැඩසටහන් උදා. SLIDA, IBSL, IPM, MILODA, විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව වැනි රජයේ ආයතන හෝ පෞද්ගලික ආයතන වලට යොමු කර ජාතික මට්ටමින් පුහුණුවීම් ලබා දීමට කටයුතු සැලසුම් කර ඇත. ඒ සඳහා දිස්ත්‍රික් මට්ටමින් පුහුණුව ලබා දිය යුතු නිලධාරින් හඳුනාගෙන මානව සම්පත් සංවර්ධන අංශයට යොමු කිරීමට කටයුතු කළ යුතුය.

සී.ඩී.කළුආරච්චි

අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත්:**

1. ලේකම්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය. -කා.දැ.ගැ.ස
2. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
3. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව -කා.දැ.ගැ.ස
4. අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
5. ප්‍රධාන ගණකාධිකාරී, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.ස
7. සියළුම අංශ ප්‍රධානින්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ

ඇමුණුම HR -01. I

**Release of funds for Capacity Building of District Starff**

**(Exp. Code:- 331.02.02.02401)**

| No. | District | No of DS Division | The Ammount of Releast to the Distict Rs. |
|---|---|---|---|
| 1 | Kalutara | 14 | 274,925.00 |
| 2 | Kandy | 20 | 392,750.00 |
| 3 | N'eliya | 10 | 196,375.00 |
| 4 | Matale | 11 | 216,012.50 |
| 5 | Kegalle | 6 | 117,825.00 |
| 6 | Kurunagala | 30 | 589,125.00 |
| 7 | Anuradhapura | 22 | 432,025.00 |
| 8 | Polonnaruwa | 7 | 137,462.50 |
| 9 | Kilinochchi | 4 | 78,550.00 |
| 10 | Mulative | 6 | 117,825.00 |
| 11 | Batticaloa | 14 | 274,925.00 |
| 12 | Trincomalee | 11 | 216,012.50 |
| 13 | Jaffna | 15 | 294,562.50 |
| 14 | Colombo | 13 | 255,287.50 |
| 15 | Gampha | 13 | 255,287.50 |
| 16 | Galle | 19 | 373,112.50 |
| 17 | Matara | 16 | 314,200.00 |
| 18 | Hambantota | 12 | 235,650.00 |
| 19 | Puttalam | 16 | 314,200.00 |
| 20 | Ratnapura | 17 | 333,837.50 |
| 21 | Badulla | 15 | 294,562.50 |
| 22 | Monaragala | 11 | 216,012.50 |
| 23 | Ampara | 20 | 392,750.00 |
| 24 | Vauniya | 4 | 78,550.00 |
| 25 | Mannar | 5 | 98,187.50 |
| | | 331 | 6,500,012.50 |

ඇමුණුම HR-01.II

**Release of funds for training of field officers on Financial Litaracy**
**(Exp. Code:- 331.02.02.02202)**

| No. | District | No of Officers | No. of programmes to be Conduct in the District | The Ammount of Releast to the Distict Rs. |
|---|---|---|---|---|
| 1 | Kalutara | 527 | 9 | 497,200.00 |
| 2 | Kandy | 898 | 15 | 844,400.00 |
| 3 | N'eliya | 365 | 6 | 342,400.00 |
| 4 | Matale | 349 | 6 | 329,600.00 |
| 5 | Kegalle | 425 | 7 | 398,800.00 |
| 6 | Kurunagala | 977 | 16 | 916,000.00 |
| 7 | Anuradhapura | 455 | 8 | 431,200.00 |
| 8 | Polonnaruwa | 171 | 3 | 162,000.00 |
| 9 | Kilinochchi | 98 | 2 | 95,200.00 |
| 10 | Mulative | 112 | 2 | 106,400.00 |
| 11 | Batticaloa | 298 | 5 | 280,400.00 |
| 12 | Trincomalee | 196 | 3 | 182,000.00 |
| 13 | Jaffna | 342 | 6 | 324,000.00 |
| 14 | Colombo | 449 | 8 | 426,400.00 |
| 15 | Gampha | 750 | 13 | 709,200.00 |
| 16 | Galle | 677 | 11 | 634,000.00 |
| 17 | Matara | 481 | 8 | 452,000.00 |
| 18 | Hambantota | 437 | 7 | 408,400.00 |
| 19 | Puttalam | 372 | 6 | 348,000.00 |
| 20 | Ratnapura | 482 | 8 | 452,800.00 |
| 21 | Badulla | 447 | 8 | 424,800.00 |
| 22 | Monaragala | 252 | 4 | 235,200.00 |
| 23 | Ampara | 389 | 7 | 370,000.00 |
| 24 | Vauniya | 113 | 2 | 107,200.00 |
| 25 | Mannar | 139 | 2 | 128,000.00 |
| | | **10201** | 172 | 9,605,600.00 |

ඇමුණුම HR-01.III

**Release of funds for training of field officers on Life Skills Delopment**
**(Exp. Code:- 331.02.02.02202)**

| No. | District | No of Officers | No. of programmes to be Conduct in the District | The Ammount of Releast to the Distict Rs. |
|---|---|---|---|---|
| 1 | Kalutara | 527 | 9 | 497,200.00 |
| 2 | Kandy | 898 | 15 | 844,400.00 |
| 3 | N'eliya | 365 | 6 | 342,400.00 |
| 4 | Matale | 349 | 6 | 329,600.00 |
| 5 | Kegalle | 425 | 7 | 398,800.00 |
| 6 | Kurunagala | 977 | 16 | 916,000.00 |
| 7 | Anuradhapura | 455 | 8 | 431,200.00 |
| 8 | Polonnaruwa | 171 | 3 | 162,000.00 |
| 9 | Kilinochchi | 98 | 2 | 95,200.00 |
| 10 | Mulative | 112 | 2 | 106,400.00 |
| 11 | Batticaloa | 298 | 5 | 280,400.00 |
| 12 | Trincomalee | 196 | 3 | 182,000.00 |
| 13 | Jaffna | 342 | 6 | 324,000.00 |
| 14 | Colombo | 449 | 8 | 426,400.00 |
| 15 | Gampha | 750 | 13 | 709,200.00 |
| 16 | Galle | 677 | 11 | 634,000.00 |
| 17 | Matara | 481 | 8 | 452,000.00 |
| 18 | Hambantota | 437 | 7 | 408,400.00 |
| 19 | Puttalam | 372 | 6 | 348,000.00 |
| 20 | Ratnapura | 482 | 8 | 452,800.00 |
| 21 | Badulla | 447 | 8 | 424,800.00 |
| 22 | Monaragala | 252 | 4 | 235,200.00 |
| 23 | Ampara | 389 | 7 | 370,000.00 |
| 24 | Vauniya | 113 | 2 | 107,200.00 |
| 25 | Mannar | 139 | 2 | 128,000.00 |
| | | **10201** | 172 | 9,605,600.00 |

ඇමුණුම HR -01. IV

**Release of funds for field officers Re fresher Training**

**(Exp. Code:- 331.02.02.02202)**

| No. | District | No of Officers | No. of programmes to be Conduct in the District | The Ammount of Releast to the Distict Rs. |
|---|---|---|---|---|
| 1 | Kalutara | 527 | 9 | 130,600.00 |
| 2 | Kandy | 898 | 15 | 221,600.00 |
| 3 | N'eliya | 365 | 6 | 89,800.00 |
| 4 | Matale | 349 | 6 | 86,600.00 |
| 5 | Kegalle | 425 | 7 | 104,600.00 |
| 6 | Kurunagala | 977 | 16 | 240,200.00 |
| 7 | Anuradhapura | 455 | 8 | 113,400.00 |
| 8 | Polonnaruwa | 171 | 3 | 42,600.00 |
| 9 | Kilinochchi | 98 | 2 | 25,200.00 |
| 10 | Mulative | 112 | 2 | 28,000.00 |
| 11 | Batticaloa | 298 | 5 | 73,600.00 |
| 12 | Trincomalee | 196 | 3 | 47,600.00 |
| 13 | Jaffna | 342 | 6 | 85,200.00 |
| 14 | Colombo | 449 | 8 | 112,200.00 |
| 15 | Gampha | 750 | 13 | 186,400.00 |
| 16 | Galle | 677 | 11 | 166,200.00 |
| 17 | Matara | 481 | 8 | 118,600.00 |
| 18 | Hambantota | 437 | 7 | 107,000.00 |
| 19 | Puttalam | 372 | 6 | 91,200.00 |
| 20 | Ratnapura | 482 | 8 | 118,800.00 |
| 21 | Badulla | 447 | 8 | 111,800.00 |
| 22 | Monaragala | 252 | 4 | 61,600.00 |
| 23 | Ampara | 389 | 7 | 97,400.00 |
| 24 | Vauniya | 113 | 2 | 28,200.00 |
| 25 | Mannar | 139 | 2 | 33,400.00 |
| | | **10201** | 172 | 2,521,800.00 |

ඇමුණුම/HR/02

උපාධි/ පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ ඉල්ලුම්පත්‍රය

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - මානව සම්පත් සංවර්ධන අංශය**

**පුහුණු/අධ්‍යයනපාඨමාලා සඳහා ඉල්ලුම් පත්‍රය**

ඉල්ලුම් කිරීමට අපේක්ෂිත පාඨමාලාවේ නම [ ]

දිස්ත්‍රික්කය -: ............................ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය -:.........................

1. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම - ..........................................................................................

..........................................................................................................................................

2. ස්ථිර පදිංචි ලිපිනය -:

..........................................................................................................................

..........................................................................................................................................

3. ස්ත්‍රී/පුරුෂ භාවය [ ]
4. තනතුර -: ................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය -:......................................
6. වර්තමාන රාජකාරී ස්ථානය-: (බැංකුව/ බැංකු සමිතිය/ප්‍රා.ලේ කාර්යාලය/ දි.ලේ /ප්‍රධාන කා.)
7. සේවා ස්ථානයේ ලිපිනය ...........................................................................................

රාජකාරී දුරකථන අංක ............................ පෞද්ගලික දු:අං -: ....................................

8. සේවය කළ කාලය -: 1. වසර ........... මාස .............. (අධිකාරියේ සේවා කාලයද ඇතුළත්ව)

11. ඉදිරියට ඇති සේවා කාලය -: වසර ........... මාස ..............

8. ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් -: ..........................................................

9. අධ්‍යනය කිරීමට අපේක්ෂිත පාඨමාලාව පිළිබඳ තොරතුරු

1. පාඨමාලාව පවත්වන අධ්‍යාපන ආයතනය -: ..............................................................

11. පාඨමාලා ගාස්තුව -: රු. ........................................................................................

111. පාඨමාලා අන්තර්ගතය/විෂය ක්ෂේත්‍රය - .......................................................

- ➢ .......................................................................................................
- ➢ .......................................................................................................
- ➢ .......................................................................................................
- ➢ .......................................................................................................

iv. පාඨමාලාවේ කාලය -: ...........................................................................................

v. පාඨමාලාවට තෝරා ගත් බව සනාථ කිරීමට අදාල ලිපිය - ......................................

10. මීට පෙර හදාරා ඇති පුහුණු / පාඨමාලා පිළිබඳ විස්තර

| පුහුණු පාඨමාලාවේ නම | ආයතනය | පාඨමාලාව හදාරන ලද විෂය | ගාස්තුගෙවූ වර්ෂය | ගාස්තුව (රු) | ගාස්තු ගෙවන ලද ආයතනය හෝ පුද්ගලයා |
|---|---|---|---|---|---|
| 1 .................... .................... | .................... .................... | .................... .................... .................... | .............. .............. | .................... | .................... |
| 2 .................... .................... | .................... .................... | .................... .................... | .............. .............. | .................... .................... | .................... .................... |

11. බැංකු ගිණුමේ තොරතුරු:-

i. බැංකුවේ නම

ii.ගිණුම් අංකය

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කර ඇති චක්‍රලේඛයට ප්‍රකාරව හා කොන්දේසිවලට යටත්ව ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා පාඨමාලා ගාස්තු ඉල්ලුම් කරන අතර, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සාවද්‍ය තොරතුරු ලබාදී බවට ඔප්පු වුවහොත්මේ සඳහා සියලු වරප්‍රසාද අහිමිවන බවය, විනය ක්‍රියාමාර්ගයන්ට යටත් වන බව දනිමි.

.................................. ..................................

අයදුම්කරුගේ අත්සන දිනය

<u>අංශ ප්‍රධානී / සමෘද්ධි දිස්ත්‍රික් ප්‍රධානී/ සමෘද්ධි ප්‍රාදේශීය ප්‍රධානී ගේ නිර්දේශය</u>

මෙම නිලධාරියා රාජකාරි කරන විෂය අනුව ඉහත පාඨමාලාව හැදෑරීම සඳහා සුදුසු බව නිර්දේශ කරමි.

.................................. ..................................

අත්සන (මුද්‍රාව සහිතව) දිනය

<u>මානව සම්පත් සංවර්ධන අංශයේ නිර්දේශය / අනුමැතිය</u>

ඉහත නිලධාරියා පුහුණු වැඩ සටහනට සහභාගී කිරීමට සුදුසු බවත්, ඒ සඳහා පාඨමාලා ගාස්තු ගෙවීම සුදුසු බවත් සහතික කරමි.

......................

අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ /සහකාර අධ්‍යක්ෂ

මානව සම්පත් සංවර්ධන අංශය

---

කාර්යාල ප්‍රයෝජනය සඳහා

ගොණු අංකය..................................

චෙක්පත ලැබී ඇත/නැත

.............................

නිළධාරියාගේ අත්සන

ඇමුණුම/HR/03

**<u>උපාධි/ පශ්චාත් උපාධි/ වෘත්තීය සංවර්ධන පාඨමාලා හැදෑරීම සඳහා මූල්‍ය ප්‍රතිපාදන ලබාදීමේ ගිවිසුම් පත්‍රය</u>**

**සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව**

**<u>අධ්‍යයන / පුහුණු පාඨමාලා ගිවිසුම් පත්‍රය</u>**

නිලධාරියාගේ නම -: ................................. ජා.හැ.අංකය -: ...............................

තනතුර -: .................................

සේවා ස්ථානය -: .................................

20......................

අධ්‍යක්ෂ ජනරාල්

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව.

...................................................................................................... පාඨමාලාව

සඳහා සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් හෝ සමෘද්ධි ප්‍රජාමූල බැංකුව හෝ සමෘද්ධි ප්‍රජාමූල බැංකු සමිතියේ පුහුණු අරමුදලින් මා වෙනුවෙන් ලබාදෙන ලද රු.................................. ක මුදල නිත්‍ය වශයෙන්ම ඒ සඳහා වියදම් කරන බවත් පාඨමාලාව අවසානයේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මා වසර 05 ක අඛණ්ඩ සේවා දායකත්වය ලබා දීමටත් පාඨමාලාව සාර්ථකව අවසන් කිරීමටත් එසේ කිරීමට නොහැකි වුවහොත්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මා වෙත එකී පාඨමාලාව හැදෑරීම සඳහා ලබාදෙන ලද පාඨමාලා ගාස්තුව ආපසු ගෙවීමට එකගවන බවටත් කැමැත්ත ප්‍රකාශ කරමි. තවද දෙපාර්තමේන්තු අනුමත සීමිත ප්‍රතිපාදන මත ඉහත සඳහන් පාඨමාලා ගාස්තුව මිස මේ සඳහා කිසිදු ගෙවීමක් සිදුනොකරන බවද දනිමි.

..................................

අයදුම්කරුගේ අත්සන

........................................................මයා/මිය පාඨමාලා ගාස්තු අයදුම් කරන දිනට විනය කටයුතු සම්බන්ධ කිසිදු පරීක්ෂණයකට භාජනය නොවූ බවටත්, ඒ හේතුවෙන්ඔහුගේ/ඇයගේ සේවය අත්හිටුවීමකට ලක්කර නොමැති බවටත් නිර්දේශ කරමි.

දිනය -:................................. අත්සන -:.................................

තනතුර-: අංශ ප්‍රධානී/

සමෘද්ධි දිස්ත්‍රික් ප්‍රධානී/ප්‍රාදේශීය සමෘද්ධි ප්‍රධානී

ඇපකරු ප්‍රකාශය

අයදුම්කරු පාඨමාලාව සාර්ථකව හදාරා අවසන් කිරිම පැහැර හරිනු ලැබුවහොත් හෝ වෙනත් ක්ෂේත්‍රයකට මාරු වුවහොත් හෝ ඔහු/ඇය විසින් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් හෝසමෘද්ධි ප්‍රජා මූල බැංකුව හෝ සමෘද්ධි ප්‍රජා මූල බැංකු සමිතිය මෙම පුහුණුව සඳහා ලබා ගන්නා ලද මුදල ඔහුගේ/ඇයගේ ඇපකරුවන් වශයෙන් අපගේ වැටුපෙන් අයකර ගැනිමට එකඟ වෙමු.

....................................... ........................................

1. ඇපකරුගේ අත්සන/නම 2. ඇපකරුගේ අත්සන/නම

තනතුර -:................................. තනතුර -:.................................

ජා.හැ.අ. -:................................. ජා.හැ.අ. -:.................................

ඉහත ගිවිසුම් ප්‍රකාරව...........................................................................මයා/මිය/මෙය සමග ගිවිසුම පිලිගැනිම තහවුරු කරමි.

.................................

අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ

මානව සම්පත් සංවර්ධන

## පුහුණු මධ්‍යස්ථාන වල කාර්තුමය ප්‍රගතිය

**පුහුණු මධ්‍යස්ථානයේ නම :**

| අනු අංකය | පුහුණු වැඩසටහන පවත්වනලද දින හා කාල පරාසය | පුහුණු වැඩසටහනේ/ වැඩමුළුවේ නම | පවත්වනලද ආයතනය/ අංශය | සහභාගි වූ සංඛ්‍යාව | ඇස්තමේන්තු මුදල (රු.) | වැයවූ මුදල (රු.) | මධ්‍යස්ථානයේ ලාභය ( ලද අදායමෙන් වියදම් අඩු කළ පසුව ඉතිරි මුදලවේ. සමෘද්ධි දෙපා. වැඩසටහන් සඳහා අදාළනොවේ. හිස්ව තබන්න) |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

පුහුණු මධ්‍යස්ථානයේ ත්‍රෛයිමාසික මූල්‍ය ප්‍රගතිය නිවැරදි හා සත්‍ය බව සහතික කරමි.

සකස් කළේ : නම -

අත්සන -

පරීක්ෂා කළේ : නම -

අත්සන -

ස්ථාන භාර නිළධාරි/ නිළමුද්‍රාව

## පුහුණු මධ්‍යස්ථාන වල කුඩා ව්‍යාපෘති මගින් ලැබෙන ආදායම්

| අ.අ | පුහුණු මධ්‍යස්ථානයේ කුඩා ව්‍යාපාරය | ලබා ගත් ආදායම (රු.) | වියදම (රු.) | ලාභය (රු.) | වෙනත් |
|---|---|---|---|---|---|
| 1 | උදා: ගම්මිරිස් වගාව | | | | |
| 2 | පොල් වගාව | | | | |
| 3 | ගෙවතු වගාව | | | | |
| 4 | කිරි ගව පාලනය | | | | |
| 5 | එළු පාලනය | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| 12 | එකතුව | | | | |

පුහුණු මධ්‍යස්ථානයේ අදාළ භූමි ප්‍රදේශය තුළ සිදු කරන ලද කුඩා ව්‍යාපෘති මගින් ලැබෙන ආදායම් වියදම් ලාභය නිවැරදිව ගණන් බලා ඇති අතර අදාළ තොරතුරු සත්‍ය බව සහතික කරමි.

සකස් කළේ : නම -
අත්සන -

පරීක්ෂා කළේ : නම -
අත්සන -

සහතික කළේ
අත්සන -
ස්ථාන භාර නිළධාරි/ නිළමුද්‍රාව

# මානව සම්පත් සංවර්ධන අංශයේ දිස්ත්‍රික් වැඩසටහන් හි ප්‍රගතිය

| අනු අංකය | පුහුණු වැඩසටහනේ නම | සහභාගි වූ ප්‍රමාණය | | | | ප්‍රතිපාදන මුදල (රු.) | ඇස්තමේන්තු මුදල (රු.) | සත්‍ය වියදම (රු.) | ප්‍රතිපාදන මුදලට අමතරව මුදල් යොදවා ගන්නේ නම් ඒ පිළිබඳ විස්තර | | පුහුණු වැඩසටහන ඇගයීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | කළමණාකරුවන් | සං. නිළ | වෙනත් | එකතුව | | | | | | ඉතා හොඳයි | හොඳයි | සතුටුදායකයි | දුර්වලයි |
| | | | | | | | | | ආයතනය | මුදල (රු.) | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | |

ඉහත සඳහන් තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි

සකස් කළේ :

පරීක්ෂා කළේ :

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ/ නිළමුද්‍රාව